7.1.3 ලිඛිත විභාගයේ විෂයයන් පහත දැක්වේ :-

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| 2. සමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 1. අභියෝග්‍යතාව | පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 2. සමාජ සංවර්ධනය පිළිබඳ සාමාන්‍ය දැනුම | ග්‍රාමීය හා ජාතික මට්ටමේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජයීය, සංස්කෘතික, ආර්ථික හා අනෙකුත් සමාජ සංවර්ධනයන්ට අදළ සාධක පිළිබඳ අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

7.2.1 ලිඛිත විභාගයේ වැඩිම මුළු ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පුරප්පාඩු ප්‍රමාණය මෙයින් දෙගුණයක් හා සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් ලැබීම අදළ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකමක් ලෙස නොසැලකේ.

7.2.2 ලකුණුදීමේ පටිපාටිය පහත පරිදි වේ :-

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 30 | |
| විභාගය | ලකුණු | | |
| අ. පො. ස. (සා. පෙළ) විභාගය | 12 | | |
| අ. පො. ස. (උ. පෙළ) විභාගය | 18 | | |
| 2. පළපුරුද්ද : තනතුරට අදළ ක්ෂේත්‍රයක ලබා ඇති පළපුරුද්ද මෙහි දී සලකා බලනු ලැබේ. | | 50 | අදාළ නොවේ |
| 3. වෘත්තීය සුදුසුකම් : ක්ෂේත්‍රයට අදළව රජයේ හෝ රජය පිළගත් ආයතනයක හදරා ඇති වෘත්තීය පුහුණු හා පාඨමාලා සඳහා | | 15 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | | 05 | |
| මුළු ලකුණු | | 100 | |

7.3 ලිඛිත පරීක්ෂණයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණුවල මුළු එකතුව අනුව වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් බඳවා ගැනීම් සඳහා තෝරාගනු ලැබේ.

8. *බඳවා ගැනීම :*

ඉහත 5 යටතේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති, ලිඛිත විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලබන අයදුම්කරුවන් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-01-2006A) දිවිනැගුම සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවාගනු ලැබේ. බඳවා ගන්නා ප්‍රමාණය පවතින පුරප්පාඩු සංඛ්‍යාව, සේවා අවශ්‍යතාවය හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

9. *වැටුප් පරිමාණය :*

9.1 වැටුප් කේත අංකය : MN 01-2006 A

9.2 වැටුප් පරිමාණය : රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320-රු. 22,040

